කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) 2012/2013
2015 දෙසැම්බර් /2016 පෙබරවාරි
මානවශාස්ත්‍ර පීඨය

## සිංහල -SINH E 1025

## චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය

පළමුවන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට(05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව: 10 යි. කාලය: පැය 03 යි.

### 1 කොටස

01. (අ) පහත දැක්වෙන ඡේදය ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය දක්වන්න.

බෝසතාණන් වහන්සේ වදාළ කාරණය අසා රජ්ජුරුවෝ, ''කිමෙක් ද සේනකයෙනි'' යි කීහ. ''ඇසුව මැනැව, දේවයන් වහන්සැ''යි ගාථායෙකින් කාරණය දක්වනු පිණිස, ''කායාදි සංයමයක් නැති වත් යමෙක් පරිවාර සම්පත් ඇත්තේ වී නම්, එබඳු ඉසුරුමත් පුරුෂ තෙමේ, මහ පිරිස පිරිවරා අධිකරණයෙහි හිඳ, අනුනට මෙ ලොවින් පර ලොවින් වැඩක් වන කාරණයක් වත් අවැඩක් වන කාරණයක් වත් කියන්නේ වී නම්, තේජස්වී හෙයින් සභා මධ්‍යයෙහි ඔහුගේ බස ම නැඟෙන්නේ ය. ඉසුරුමත් තැනැත්තේ හිමියන් නොහිමි කිරීම් ආදී වූ අවැඩට සුදුසු බසකුදු කියන්නේ වී නම්, තේජස්වී හෙයින් සභා මධ්‍යයෙහි ඔහු ගේ බස ම නැඟෙන්නේ ය. ඉසුරුමත් තැනැත්තේ හිමියන් නොහිමි කිරීම් ආදී වූ අවැඩට සුදුසු බසකුදු කියන්නේ වී නම් සභාවට ඇදැහිය යුතු බව ශ්‍රී කාන්තා මැ කරන්නී ය. ප්‍රඥා තොමෝ එසේ කොට ලිය නොහෙන්නී ය. මේ කාරණය ද දැන මම, 'නුවණැත්තෝ යටත්හු ම ය. ශ්‍රීමත් ඇත්තෝ මැ උතුමැ'යි කියමී''යි කීහ. නැවැත රජ්ජුරුවන් විසින්, ''කිමෙක් ද පුත, මහෞෂධ පණ්ඩිතයෙනි''යි කී කල්හි පණ්ඩිතයන් වහන්සේ, ''මේ කෙළතොලු සේනකයා කුමක් දනී ද''යි වදාරා ගාථාවෙකින් කාරණයක් වදාරන සේක්, ''මඳ නුවණැති බාල තෙමේ අනුන් නිසා වත් තමා නිසා වත් බොරු බෙණෙයි නම්, හේ සභා මැද නින්දත් ලබයි; පර ලොව අපායගාමී ද වෙයි; මේ කරුණත් බලා, 'නුවණැත්තේ උතුමැ, නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ උතුම් නො වෙයි' මම කියමී'' කී හ. (ලකුණු 10)

(ආ) පහත දැක්වෙන පද්‍ය පන්තියේ අදහස ලිහිල් බසින් ලියා රසාස්වාදය කරන්න.

මී හ ඔ මුව මඬල මෙන් දිලෙන හැම වි ට
දු ල බ ඉසුරු පිරිසැදි ඒ වෙහෙර සි ට
කි ර ඔ පොකුරු මී රස ලැබ බොන ලෙස ට
න ර ඔ මිතුර තගෙ නෙත සිත සතුටු කො ට

දි මු ත් වෙහෙරවට විසිතුරු මල් වතුය
එ හි ත් සුවඳ මල් නිතිවෙයි මිණි මුතුය
ම හ ත් තුරු මියුරු පල ගෙන නැමී අතුය
රැ ග ත් සෙවණ නො හැර ම සිටි පොල් වතුය

| | | |
|---|---|---|
| නොයෙක් තැන ම පිපිමල් පිරුණු පො | කුණුය | |
| ගෙ ය ක් කනම සැදූහෙන් දෙවන ද | කුණුය | |
| සු ද ක් ලෙස තිබෙයි මළු මං හැර | කුණුය | |
| සි ය ක් අය කෙරෙති වැඳ පුද පැද | කුණුය | |
| නුදුරුව සිහි ලැ ලී ය ගඟු | ලැලීය | |
| වට සැදි මල් වැ ලී ය සුදු | වැලීය | |
| පිපි වන සිටි ම ලී ය වන | මලීය | |
| තුටු වන සිති වි ලී ය පුල් | විලීය | |
| ප ව න ද පිපි තුරේය නිර | තුරේ ය | |
| කුසු මන් පෙති තුරේය මළු | තුරේ ය | |
| අවට සුපිපි සරේය බිඟු | සරේ ය | |
| සිත එවෙහෙර කෙරේ ය ලොබ | කෙරේ ය | (ලකුණු 10) |

## 11 කොටස

(02) ''උම්මග්ග ජාතකය උපහාසය තුළ ගැන්වෙන බෝසත් සිරිතකි.'' විමසන්න.

(03) සිංහල සන්දේශාවලියෙහි හංස සන්දේශයට හිමි වන්නේ කෙබඳු ස්ථානයක් දැ යි පැහැදිලි කරන්න.

(04) ''පන්සිය පනස් ජාතක පොත කුරුණෑගල යුගයේ ජයස්තම්භයයි.'' මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

(05) ගම්පොළ සාහිත්‍ය යුගයේ විද්‍යමාන වන සංකීර්ණ ලක්ෂණ පිළිබඳ විමර්ශනයක් කරන්න.

(06) ''කෝට්ටේ යුගය විවිධත්ත්වයෙන් විචිත්‍ර වූ අවධියකි.'' සාකච්ඡා කරන්න.

## 111 කොටස

(07) සමකාලීන සාමාන්‍ය ජන ප්‍රයෝගානුකූල භාෂා ව්‍යවහාරයේ දී භාවිත වන සිංහල අක්ෂර මාලාව සාම්ප්‍රදායික ඡේක ප්‍රයෝගානුකූල භාෂා ව්‍යවහාරයේ දී භාවිත වන අක්ෂර මාලාවෙන් වෙනස් වන ආකාරය පහදන්න.

(08) ''භාෂාව සංස්කෘතියේ ප්‍රධාන වාහකයාය.'' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

**නැතහොත්**

සිංහල භාෂා ද්විරූපතාව පිළිබඳ විමර්ශනයක් කරන්න.

(09) ප්‍රාදේශීය උපභාෂා, සමාජීය උපභාෂා, ප්‍රාස්තාවික භාෂා වෙන් වශයෙන් හඳුන්වා තමන් කැමති එක් ප්‍රාදේශීය උපභාෂාවක් පිළිබඳ විස්තරයක් කරන්න.

(10) පහත සඳහන් මාතෘකාවලින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

| | |
|---|---|
| 1. ආයාසී සන්ධි හා නිරායාසී සන්ධි | 11. පූර්ව නාසික්‍ය ව්‍යංජන |
| 111. නිපාත ක්‍රියා | 1v. අනම්‍යාදේශය |
| v. ස්ථානය හා කරණය | vi. ඝෝෂ මහාප්‍රාණ හා අඝෝෂ මහාප්‍රාණ |
| vii. ෂට් කාරක | viii. සංකීර්ණ වාක්‍ය රටා |

(2 සිට 10 දක්වා පිළිතුරුවලට ලකුණු 20 බැගින්)